මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

# වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

# වෙළඳ ජාතික තනි කවුළු පද්ධති ව්‍යාපෘතිය (TNSWSP)

# පුරප්පාඩු නිවේදනය

දේශසීමා මායිම් ආශ්‍රිත වෙළඳ කටයුතු නියාමනය කිරීමේ නියෝජිතායතන වෙත වෙළඳුන් විසින් දේශසීමා මායිම් හරහා සිදුවන සිය වෙළඳ ප්‍රවාහයන් (ආනයන, අපනයන හා ප්‍රතිනැව්ගත කිරීම්) පිළිබඳ ලේඛන හා දත්ත අවශ්‍යතා ඉදිරිපත් කිරීම සඳහා තනි ප්‍රවේශ කේන්ද්‍රයක් වශයෙන් වෙළඳ ජාතික තනි කවුළු පද්ධතියක් ස්ථාපනය කිරීම සඳහා ශ්‍රී ලංකා රජය විසින් තීරණය කර තිබේ.

ඒ අනුව, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් වෙළඳ ජාතික තනි කවුළු පද්ධති ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම උදෙසාම වූ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකය (PIU) සඳහා රාජ්‍ය අංශයේ/ පෞද්ගලික අංශයේ සේවයේ නියුක්ත සේවක පිරිස අතුරින් රියදුරු සහ කාර්යාල කාර්ය සහායක තනතුරු සඳහා වඩාත්ම සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවීමට තීරණය කර තිබේ.

## 1. රියදුරු - PL3-2025 Grade III - තනතුරු 01

**සුදුසුකම් සහ පළපුරුද්ද**

- ➢ වාර දෙකකට නොවැඩි වාර ගණනකදී, අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාගයේ දී අවම වශයෙන් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් හයකින් (06) සමත්වීම;
- ➢ වලංගු රියදුරු බලපත්‍රයක් සතුවිය යුතුය සහ
- ➢ රාජ්‍ය අංශයේ/ පෞද්ගලික අංශයේ රියදුරෙකු වශයෙන් අවම වශයෙන් වසර 04ක සේවා පළපුරුද්ද.

## 2. කාර්යාල කාර්ය සහායක - PL1-2025 Grade III - තනතුරු 01

**සුදුසුකම් සහ පළපුරුද්ද**

- ➢ වාර දෙකකට නොවැඩි වාර ගණනක දී, අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාගයේ දී අවම වශයෙන් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් හයකින් (06) සමත්වීම; සහ
- ➢ රාජ්‍ය අංශයේ/ පෞද්ගලික අංශයේ කාර්යාල කාර්ය සහායක වශයෙන් අවම වශයෙන් වසර 04ක සේවා පළපුරුද්ද.

**පොදු කොන්දේසි**

I. 2026.05.04 වන දිනට වයස අවුරුදු 55ට නොවැඩි විය යුතුය.

II. තෝරාගන්නා අයදුම්කරුවන් 2027.09.30 දක්වා බඳවාගනු ලැබේ. රාජ්‍ය අංශයේ අයදුම්කරුවන් පූර්ණකාලීන පදනමින් බඳවාගනු ලබන අතර, පෞද්ගලික අංශයේ අයදුම්කරුවන් වාර්ෂික කාර්යසාධන ඇගයුම මත පදනම්ව වාර්ෂිකව කොන්ත්‍රාත්තුව දීර්ඝ කිරීමට යටත්ව, කොන්ත්‍රාත් පදනමින් බඳවා ගනු ලැබේ.

III. 2026.05.04 වන දිනට හෝ ඊට පෙර අවශ්‍ය සියලුම සුදුසුකම් සපුරාලිය යුතුය.

IV. පුරප්පාඩු පිරවීමේ හෝ නොපිරවීමේ අයිතිය මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්වරයා සතුය.

V. මෙහි සඳහන් නොවන හෝ බඳවා ගැනීමේ ක්‍රියාවලිය තුළ පැන නගින යම් ගැටලුවක් සම්බන්ධයෙන් මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්ගේ තීරණය අවසන් හා එකම තීරණය වේ.

2026 මාර්තු 28 දිනැති අංක 02/2026 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය ප්‍රකාරව වැටුප් හා අනෙකුත් ප්‍රතිලාභ හිමි වේ.

**අයදුම් කිරීමේ ක්‍රමවේදය**

අප වෙබ් අඩවියෙන් බාගත කිරීමට ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව අයදුම්පත් පිළියෙල කර, එම අයදුම්පත/ ජීව දත්ත පත්‍රිකාව සහ සහතික කරන ලද සහතික පත්‍ර 2026.05.04 වැනි දින හෝ ඊට පෙර පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපැල ඔස්සේ යොමු කරන ලෙස සියලු අයදුම්කරුවන් වෙතින් ඉල්ලා සිටිනු ලැබේ. රාජ්‍ය අංශයේ/ අර්ධ රාජ්‍ය අංශයේ අයදුම්කරුවන් සිය අයදුම්පත් ආයතන ප්‍රධානීන් හරහා යොමුකළ යුතු අතර පෞද්ගලික අංශයේ අයදුම්කරුවන් තමා පිළිබඳ තොරතුරු සැපයිය හැකි ඥාතීන් නොවන තැනැත්තන් දෙදෙනෙකු (අවසාන වශයෙන් සේවය කළ ස්ථානවල සේවාදායකයන් විය යුතුය.) සම්බන්ධ කරගත හැකි විස්තර ඇතුළුව අනෙකුත් ලේඛන සමග අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. අයදුම්පත අඩංගු කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඔබ විසින් ඉල්ලුම්කරන තනතුර සඳහන් කළ යුතුය.

**ලිපිනය:**
**ව්‍යාපෘති අධ්‍යක්ෂ,**
**වෙළඳ ජාතික තනි කවුළු පද්ධති ව්‍යාපෘතිය,**
**BMICH, 219A, දෙවන මහල, දෙවන පරිශ්‍රය,**
**බෞද්ධාලෝක මාවත,**
**කොළඹ 07.**

කෙටි ලැයිස්තුගත කරන ලද අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අතර, අයදුම්පත සමග අදාළ සියලු ලේඛන අසම්පූර්ණ ලෙස ඉදිරිපත් කිරීම තනතුර සඳහා නොසුදුසු වීමට හේතුවක් වනු ඇත.

අදාළ අයදුම්පත ලබා ගැනීම සඳහා මෙම වෙබ් අඩවිය වෙත පිවිසෙන්න **www.onetrade.lk**

**ලේකම්,**
**මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය,**
**දිනය : 2026.04.20**